විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය    தலைமுறையொன்றின் பெருமிதம்    Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. විවැ/පා01/පොදු    ඔබේ අංකය / உமது இல. / Your No. ........................    දිනය / திகதி / Date 2020.03.30

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>2020 අප්‍රේල් මස විශ්‍රාම වැටුප් ගෙවීම</u>**

2020.03.29 දින අත්‍යාවශ්‍ය සේවා ජනාධිපති විශේෂ කාර්ය සාධක බලකායේ රැස්වීමේදී සාකච්ඡා කළ පරිදි 2020 අප්‍රේල් මස විශ්‍රාම වැටුප් ගෙවීම පහත සඳහන් පරිදි සිදු කිරීමට තීරණය කර ඇත.

02. ඒ අනුව සියලුම විශ්‍රාමිකයින් අපහසුතාවයට පත් නොවන අයුරින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය හා ඔවුන්ගේ විශ්‍රාම වැටුප් නියමිත දිනයේදීම විශ්‍රාමිකයා වෙත ලබා දීමේ අවශ්‍යතාවය මත මෙම තීරණ ක්‍රියාත්මක කරනු ලැබේ.

03. ඒ යටතේ

I. විශ්‍රාම වැටුප් ගෙවීම අප්‍රේල් මස 02 හා 03 දිනයන්හිදී සිදු කෙරේ.

II. එම දින දෙකෙහි විශ්‍රාම වැටුප් ලබා ගැනීමට නොහැකි වන විශ්‍රාමිකයින් සඳහා අප්‍රේල් මස 06 වන දින ද අවශ්‍ය පහසුකම් සලසනු ලැබේ.

III. විශ්‍රාම වැටුප් ලබා ගන්නා ක්‍රමවේද වන්නේ

(a) තැපැල් කාර්යාල මඟින්

(b) බැංකු මඟින්

(c) ග්‍රාමීය බැංකු හා සණස සමිති මඟින්

IV. තැපැල් කාර්යාල මඟින් විශ්‍රාම වැටුප් ලබා ගන්නා සියලුම විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් තැපැල් දෙපාර්තමේන්තුව මඟින් අදාළ විශ්‍රාමිකයාගේ නිවසටම හෝ එම විශ්‍රාමිකයාට විශ්‍රාම වැටුප් ලබා ගත හැකි ආසන්නතම ස්ථානයට ගෙනගොස් භාරදීමට කටයුතු කරනු ඇත. තැපැල්පතිගේ ඉල්ලීම අනුව තැපැල් කාර්යාල මඟින් විශ්‍රාම වැටුප් ලබා ගන්නා විශ්‍රාමිකයින්ගේ තොරතුරු තැපැල් කාර්යාල වෙත ලබා දිය යුතුය.

V. බැංකු ගිණුම් මඟින් මුදල් ලබා ගැනීමට බලාපොරොත්තු වන විශ්‍රාමිකයින්ට පවත්නා ආරක්ෂක විධිවිධාන තුල ඇතිවන අපහසුතාවයන් අවම කිරීම සඳහා ත්‍රිවිධ හමුදාව හා පොලීසිය අවශ්‍ය ගමන් පහසුව සලසනු ලැබේ.

මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

VI. ඒ අනුව ඉහත දැක්වූ පරිදි අප්‍රේල් 02,03 සහ 06 දිනයන්හිදී අදාළ බැංකු ශාඛා මගින් විශ්‍රාම වැටුප් ලබා ගැනීමට හැකි වන පරිදි ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වන විශ්‍රාමිකයින්ගේ නාම ලේඛණය මේ වන විටත් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත සපයා ඇත.

VII. ත්‍රිවිධ හමුදාව විසින් සිදු කරන මෙම කාර්යය සඳහා අවශ්‍ය සහාය ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අදාළ සියලුම නිලධාරීන් හා අවශ්‍ය පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ද, ග්‍රාමීය මට්ටමින් අදාළ ග්‍රාම නිලධාරීන්ද යොදා ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරමි.

VIII. ග්‍රාමීය බැංකු හා සණස සමිති මගින් විශ්‍රාම වැටුප් ලබා ගන්නා විශ්‍රාමිකයින්ටද ඉහත දිනයන්හිදී තම විශ්‍රාම වැටුප් ලබා ගත හැකි වන පරිදි ඉහත ක්‍රමවේදයම අනුගමනය කරමින් විශ්‍රාම වැටුප් ලබා දීමට කටයුතු කිරීම සුදුසු වේ.

04. විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලියට සම්බන්ධ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව නියෝජනය කරන කාර්යය මණ්ඩලයන්ට හා පෞද්ගලික බැංකු නියෝජනය කරන කාර්යය මණ්ඩලයන් සඳහා ඔවුන්ගේ ඉල්ලීම මත ඇඳිරිනීති බලපත්‍ර නිකුත් කිරීම හා ගමනාගමනය සඳහා අවශ්‍ය පහසුකම් හා සම්බන්ධීකරණය සැලසීම සුදුසුය.

05. මෙම COVID 19 වෛරසය සම්බන්ධයෙන් සිදු කරනු ලබන ආරක්ෂක විධිවිධාන හා එම මෙහෙයුම් ක්‍රියාවලියේදී ඔබ විසින් දැනටමත් විශාල කාර්ය භාරයක් සිදු කරනු ලබන අතර එම කාර්යයන් අතරතුර විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියද රජය විසින් ගනු ලැබූ තීරණය මත ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ දක්වන සහයෝගය බෙහෙවින් අගය කරමි.

ඒ. ජගත් ඩී. ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් -

| | |
|---|---|
| 01. ජනාධිපති ලේකම් | - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස. |
| 02. අග්‍රාමාත්‍ය ලේකම් | - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස. |
| 03. ලේකම්, රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස. |
| 04. ලේකම්, මුදල් අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස. |
| 05. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස. |
| 06. යුද්ධ හමුදාධිපති | - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස. |
| 07. තැපැල්පති | - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස. |
| 08. පොලිස්පති | - කරු.දැ.ගැ.ස. හා පහසුකම් සැලසීමට |
| 09. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් | - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස. |